- දුවේ පුතේ"
- පාසලේ පැවැත්වූ සාහිත්‍ය සමිතියක අවස්තාවක් පහත එය හොඳින් කියවන්න දැක්වේ.

මෙහෙයවීම 1 : සුබ උදෑසනක් ! ආයුබෝවන්
මුලින් ම තිබෙන්නේ ඔබ සැම පිළිගැනීම යි. පිළිගැනීමේ කතාව කිරීම සඳහා යසිරු සොහොයුරාට ආරාධනා කරනවා.

මෙහෙයවීම 1 : ස්තුති යි ඔබට !
මීළඟට සමූහ ගීතයක් ගායනා කිරීමට ආරාධනා කරන්නේ රෝස කණ්ඩායමේ සොහොයුරු සොහොයුරියන්ට යි.

මෙහෙයවීම 1 : බොහොම ස්තුතියි ඔබ සියලු දෙනාට ම.
මේ ආරාධනය කියවීමේ විශේෂාංගය ඉදිරිපත් කරන කවීශා සොහොයුරියට යි.

මෙහෙයවීම 1 : ස්තුතියි කවීශා.
දැන් අපේ අරලිය කණ්ඩායම සූදානම් ගීතයකට අනුව නර්තනයක් ඉදිරිපත් කිරීමට.
ඔබට යි මේ අවස්ථාව

මෙහෙයවීම 1 : අපේ සමිතියේ කටයුතු සමාප්ත කිරීම සඳහා ස්තුති කතාව කිරීමට මා රවිඳු සොහොයුරාට ආරාධනා කරනවා.

මෙහෙයවීම 2 : අද අපේ සාහිත්‍ය සමිතිය ඉතා හොඳින් පැවැත්වුණා. ඒ සඳහා සහභාගි වූ සැම දෙනාට ම ස්තුතිය පුද කරනවා.
මීළඟ සමිති වාරයේ දී අපි හමු වීමේ බලාපොරොත්තුවෙන් අදට සමු ගන්නවා.
ස්තුති යි.

පිලිතුරු ලියන්න

1)පිළිගැනීමේ කතාව කළේ කවුද?...................................................................
2)රෝස කණ්ඩායම ඉදිරිපත් කළ විශේෂාංගය කුමක් ද ?...........................................
3) කියවීමේ විශේෂාංගය ඉදිරිපත් කළේ කවුද ?........................................................
4) නර්තනය ඉදිරිපත් කළ කණ්ඩායම කුමක් ද ?....................................................

මෙවන් සමිතියක විශේෂාග පත්‍රයක් සකස් කරන්න.

1. පිළිගැනීමේ කතාව
2. සමූහ ගීතය
3. කියවීමේ විශේෂාංගය
4. ගීතයට අනුව නර්තනය
5. ස්තුති කතාව

නිවසේ දී වැඩිහිටියන් හා එක්ව සාහිත්‍ය සමිතියක් පවත්වන්න